කියන්නේ මගේ මුණුබුරාලගේ වයසේ අය, ප්‍රේමය ගැන හිතන්නේ කොහොමද කියලා මම දන්නේ නෑ. අපි තරුණ කාලේ කෙල්ලට කෙල්ලගේ නම කියනවා. නැත්නම් හුරතල් නමක් තියනවා නම් ඒක කියනවා. දැන් තරුණයෝ පෙම්වතියට කියන්නේ නංගි කියලා. තරුණියෝ පෙම්වතාට කියන්නේ අයියා කියලා. අනෙක් දේවලුත් ඔයවගේ වෙනස්වෙලා. ඒවා අපිට තේරුම්ගන්න බෑ.

**අපි දශක කීපයක් අතීතයට යමු. ඔබ තරුණ කාලේ ප්‍රේමය අත්වින්දේ කොහොමද? සිනමාවේ එය නිරූපනය කෙරුණේ කොහොමද?**

පනහ හැටේ දශකවල කොච්චර නවීණ පන්නයට හැඩගැසුණ තුරුණු යුවලක් වුණත් අත්වැල් අල්ලගෙන පාරේ ඇවිදින්නේ නෑ. සිපගැනීම පවා වපර ඇහින් බලන යුගයක්. ඒ ඇර කතෝලික ආගමේ හැටියට ඒක පාපයකුත් කියලා මම හිතුවා. බෞද්ධ ආගමේ අය වුණත් මේවා විවාහවීමෙන් පසුව කළ යුතු දේවල් විදිහට තමයි සැළකුවේ. අනිත් එක දැන් සරම ඇඳපු යුවලක් කවදාවත් එකට යන්නේ නෑ. කාන්තාව ඉදිරියෙන් යවන්නේ. ඒ වගේ ඒ කාලේ දුරස්ථව, රිමෝට් කොන්ට්‍රෝල් එකෙන් පෙම් කළ යුගයක්. චිත්‍රපටිවල ගත්තත් හැටේ දශකයේ ප්‍රේම ජවනිකාවලින් උපරිමය තමයි දැඩි වැළඳගැනීම. නළල සිපගැනීම. උඩුකය යන්තම් ප්‍රදර්ශණය කිරීමක් වෙනවා නම් වෙන්නෙත් ඉතා කලාතුරකින්. මම සිනමාවට එන්න ඉස්සර ඉඳලා මට පෙම්වතියන්ගෙන් නම් අඩුපාඩුවක් තිබුණොම නෑ. සිනමාවට ආවට පස්සෙත් එහෙමයි. විවාහයක් වෙන්න ඕනේ නිසා ඒවා ඉතිං සීමා කරන්න වුණා.

**ප්‍රවීණ නළුවෙක් විදිහට ඔබ රගපෑමක සාර්ථක අසාර්ථක බව දකින්නේ කොහොමද?**

රගපෑම පිළිබඳ ශිල්පීය දැනුම ලබාගත්ත් පමණින් සාර්ථක නළුවෙකු හෝ නිළියක වෙන්න අපහසුයි. මනුෂ්‍ය ජීවිතය ගැන විනිවිද දකින ගැඹුරු දැක්මක් තිබීම අවශ්‍යයයි. අපි හිතමු මම හැම්ලට් නාට්‍ය කරනවා කියලා. එහෙම නම් මම ඒ චරිතයට තෝරාගන්නේ ස්වාධීනව හිතලා ඒ චරිතය කරන්න පුළුවන් කෙනෙක්. දැන් ඔය හුගාක් නළු නිලියෝ කියන කතාවක් තියනවා අධ්‍යක්ෂවරයා අතේ අපි මැටි පිඩක් වුණා කියලා. ඒක බොරුවක්. මැටි පිඩක් වුණා නම් චරිතය සාර්ථකව රගපාන්න බෑ. මගේ තර්කය නම් නළුවාට හෝ නිළියට තමන්ගේම ප්‍රකාශන ශක්තියක් තිබිය යුතුයි. නැතිනම් කොහොමද අධ්‍යක්ෂවරයා කියන හැගීම් ගන්නේ?

**හැම්ලට් වගේ චරිතයක් නිරූපනය සඳහා නළුවෙකු සොයාගැනීමට ඔබට අවශ්‍ය වුවහොත් වර්ථමාන සිනමා හෝ රූපවාහිනී නළුවන් අතරින් එකවරම මතකයට නැගෙන කෙනෙක් ඉන්නවාද?**

හැම්ලට් කරන්න කෙනෙක් හොයාගන්න බැරිවෙන එකක් නෑ. අලුත්ම කෙනෙක් හරි යොදාගන්න පුළුවන්. වර්ථමාන ටෙලි නාට්‍යවල නම් හැම්ලට් වගේ චරිතයක් කරන්න පුළුවන් කෙනෙක් ඉන්න බවක් මට පෙනිලා නෑ. සිනමාවෙත් එහෙමයි. මගේ තුරුණු වියේදී මටත් දැඩි ආශාවක් තිබුණා හැම්ලට් චරිතය රගපාන්න. නමුත් අවස්ථාවක් ලැබුණේ නෑ. දැන් නම් මට හැම්ලට්ගේ චරිතය රගපාන්න බෑ. මොකද මගේ වයස පැනලනේ. ඒ කාලේ ලැබුණ නම් මම බොහොම සතුටු වෙනවා. මොකද මම විතරක් නෙවෙයි යුරෝපයේ රුසියවේ පවා නළුවන් හැම්ලට් වගේ චරිත රගපාන්න පුල පුලා බලා ඉන්නේ. මම 76දී රුසියානු චිත්‍රපටියක් බැලුවා. ඒකේ විශ්මය ජනක විදිහට හැම්ලට් චරිතය රගපාලා තියනවා. ඒ රුසියානු නළුවා හැම්ලට් චරිතය කරන්න ඉංග්‍රීසි පවා ඉගෙන ගත්තලු.

**ඔබ සිනමාවට යොමුවෙන්න බලපෑව පසුබිම මොනවගේ එකක්ද?**

පවුලේ පසුබිම බලපෑවා. විශේෂයෙන්ම අයියා රැලෙක්ස්. එයා හොඳ ඡායාරූප ශිල්පියෙක්. මම හිතන්නේ වයස පහළොවේදි, දාසයේදී වගේ තමයි අයියා ඒ වැඩේ පටන් ගත්තේ. අයියා ඉගෙන ගන්න ගත්ත ඡායාරූපවල වැඩිපුරම ඉන්නේ මම. ඒ එක්කම අපි හින්දි චිත්‍රපට ගැන දැඩි ආශාවක් දැක්වුවා. නිතර නිතර ඒවා බලන්න ගියා. ඉස්කෝලෙන් අස්වෙලා පනස් හතේ අටේ විතර මම විදුලි දෙපාර්ථමේන්තුවේ ලඝු ලේඛකයෙක් වශයෙන් වැඩකළා. මට ඒ කාලේ හිත සන්සුන් නැති බවක් දැනුනා. අයියගේ යාලුවෙක් ආතර් යූ අමරසේන. දවසක් එයා මාව එක්ක ගියා සිරිසේන විමලවීර ළගට චිත්‍රපටියක රගපාන්න අවස්ථාවක් අරන් දෙන්න. එතනදි මට දෙබස් වගයක් කියන්න දීලා එයා ආරම්භ කරන්න ගිය චිත්‍රපටියකට තෝරා ගත්තා. පුංචිඅම්මා කියන ඒ චිත්‍රපටිය අවසන කරන්න බැරිවුණා. ඊට පස්සේ විමලවීරගෙම 'රොඩී කෙල්ල' චිත්‍රපටියේ උප ප්‍රධාන චරිතයකට මාව තෝරගත්තා. ඒ චිත්‍රපටිය අවසන් කරන්න කලින් විමලවීර මැරුණා. පස්සේ ටී. සෝමසේකරන්ගේ චිත්‍රපටියකට මාව තෝරාගත්තා. කිංස්ලි රාජපක්ෂ අධ්‍යක්ෂණය කරපු ඒ චිත්‍රපටිය තමයි 'දීපශිකා'. සෝමසේකරන් මේක කරන්න යනකොට ප්‍රධාන චරිත දෙකට තෝරගෙන හිටියේ මමයි කැලැරිස් ද සිල්වයි දෙන්න. කිංස්ලි රාජපක්ෂ කරනකොට ඒ වෙනුවට කිත්සිරි පෙරේරයි සන්ධ්‍යා කුමාරියි යොදාගෙන තිබුණා. මම චිත්‍රපටියේ පිටපත ඉල්ලුවා කියලා තමයි මාව කපලා දාලා තියෙන්නේ පණ්ඩිතයෙක් කියලා. නමුත් ඇත්තටම මම පිටපත ඉල්ලුවේ පණ්ඩිතකමකට නෙවෙයි. පිටපත කියවලා චරිතය තේරුම් අරගෙන හොඳ රගපෑමක් කරන්න.



ඒකෙනුත් මම පසුබට වුණේ නෑ. දිගින් දිගටම ඉන්ටවීව්වලට ගියා. ලෙස්ටර්ගේ ගම්පෙරළිය චිත්‍රපටියේ බලදාසගේ චරිතයට මාව තෝරාගත්තේ ඒ යන ගමනේදි. එතනින් තමයි සිනමාවට ආවේ.

**ඔබ නවකතා පොත් කීපයකුත් රචනා කරලා තියනවා. සාහිත්‍යය පැත්තට යොමුවුණේ කොහොමද?**

ඒවා මේ මුදල් ප්‍රශ්ණවලට උත්තර හොයන්න කළ දේවල්. ඒ නවකතා ලියපු එක ගැන නම් දැන් මම කණගාටුවෙනවා. වැඩි කැමැත්තකින් කළ දේකුත් නෙවෙයි. සමහර වෙලාවට අපිට අපි අකමැති දේවලුත් කරන්න වෙනවනේ.

**ඔබේ පවුලේ වර්ථාමන තොරතුරු ටිකක් කියන්න කැමතිද?**

සහෝදර සහෝදරියෝ අටයි. අයියා අවුරුදු අටකට කලින් මැරුණා. බාලම සොහොයුරාට වැඩිමල් සොහොයුරාත් ජර්මණියේ පදිංචිවෙලා ඉන්නකොට මැරුණා. නංගිලා දෙන්නගෙන් එක්කෙනෙක් නිව්යෝර්ක්වල. එක්කෙනෙක් ජර්මන්වල පදිංචිවෙලා ඉන්නවා. අනිත් සහෝදරයා තවමත් ජර්මන්වල. මගේ ලගට නංගි ඉන්නේ මෙහෙ. ඒ අය හැමෝම බැඳලා ළමයින්ගේ ළමයිනුත් ඉන්නවා. අපි දුරින් ජීවත්වුණාට අර ආදරේ බැම්බ වෙනස්වෙලා නෑ. මගේ බඩේ සැත්කමට ගිය වෙලාවේ ළග තකනෙක් ඉන්න ඕනේ වුණාම මගේ මල්ලි හිටියා. රෑ මාත් එක්ක ඉඳලා උදේ එයාගේ ජොබ් එකට යනවා. ප්‍රේමය පදනම් කරගත් විවාහයක් වුණේ. මගේ දුව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ප්‍රධානියා. පුතාල තුන්දෙනයි. නෝනා සිරිමා වික්‍රමසූරිය. ඇය අවුරුදු කීපයකට කලින් මියගියා.

**කලාකරුවෙක් විදිහට ආපසු හැරී ජීවිතය දිහා බලනකොට මොනවගේ හැගීමක්ද ඇතිවෙන්නේ?**

තමන් සම්බන්ධ වූ කලා කෘති දෙස ආපහු හැරී බැලුවම, මම හිතන්නේ නෑ කිසිම කලාකාරයෙක් තෘප්තිමත් වේවි කියලා. මගේ රගපෑමකට විශිෂ්ඨ සම්මානයක් ලැබුණත් පසුව ඒක මම බලනකොට හිතෙනවා මේක මීට වැඩිය හොඳට කරන්න තිබුණා නේද කියලා. ඒ කියන්නේ දැන් තියන දැනුම මට හැට හතරේ තිබුණේ නෑ. නමුත් සංසන්දනාත්මකව බැලුවම හොලිවුඩ්වල හෝ බොලිවුඩ්වල චිත්‍රපටි කීපයක රගපෑවත් ආර්ථික අතින් එක්තරා තත්ත්වයකට එන්නට පුළුවන් කම තියනවා. මම එහෙම තත්ත්වයකට ආවයි කියලා කියන්නේ නෑ. ඒක නිසා නෙවෙයි මම කණගාටුවෙන්නේ. මට කියලා පෞද්ගලික් ආදායමක් තිබුණා නම් මම පූර්ණ කාලීන වෘත්තීය නළුවෙක් නොවෙන්න තිබුණා. වේදිකාවේ යමක් කරන්න මගේ යම් යම් අදහස් තිබුණා. දැන් නම් ඉතිං ඒ සියල්ල යල්පැන ගිහිල්ලා.

**ඔබ වෘත්තිය වශයෙන් රගපෑම තෝරාගන්නේ එවකට කරමින් සිටි කිසියම් පිළිගැනීමක් සහිත රැකියාවකින් ඉවත්වෙලා. එදා ඒ ගත්ත තීරණය ගැනත් දැන් කණගාටුවෙනවද?**

සිනමාවට ආවට පස්සේ මම කාර්ය බහුල වුණා. මගේ රස්සාව ස්ථිර වුණත් විශ්‍රාම වැටුප් හිමිකමක් තිබුණේ නෑ. ඒකට තව අවුරුදු තුනක් ඉන්න ඕනේ. නළුකම කරනවද තවදුරටත් රස්සාව කරනවද කියලා තීරණය කරන්න වුණාම මම තීරණය කළා රස්සාවෙන් අයින්වෙන්න. ඒ ගැන මම කවදාවත් කණගාටු වෙන්නේ නෑ. මොකද ලඝු ලේඛකයෙක් හැටියට හිටියා නම් මට යන්න තිබුණ ඉහළම තැන සුප්‍රිම් උසාවියේ ලඝු ලේඛක තනතුරකට හරි හැන්සාඩ් වාර්තාකරුවෙකුගේ තනතුරකට හරි තමයි. ඒ දෙකම කරලා තිබුණත් නළුවෙක් විදිහට ලබාගන්න පුළුවන් තෘප්තිය ලබාගන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නෑ. රගපෑම කියන්නේ නලුවෙක් හෝ නිළියක් විසින්ම කරන දෙයක්නේ. අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂණය කරන්න පුළුවන්. නමුත් රගපාන්නේ නළුවනේ. ඒක හොඳට කරනවා කියලා කියනකොට ඇතිවන ඉහ වහා යන සතුට නළුවන්ට නිළියන්ට පමණක්ම ඇතිවෙන විශේෂ සතුටක්. මම ඒ සතුට නොමදව අත්විඳලා තියනවා.

## පසු සටහන

*ටෝනි 'සන්නස' හා කළ සංවාදය අතරතුර ඔස්ට්‍රේලියාවේ වෙසෙන සිය සහෘද රසිකයන්ගෙන් කාරුණික ඉල්ලීමක් කළේය. එනම් ඕස්ට්‍රේලියාවේ සිටි සහ සිටින නාමධාරී ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ තොරතුරු සහ ඡායාරූප හැකි පමණින් එකතුකර දෙන ලෙසණි. ඒ සඳහා ඔබට 0777 366366 සහ 011 2774015 දුරකථන අංක ඔස්සේ ටෝනි ඇමතිය හැකිය.*


**Need Professional Help With Your Tax Returns & Accounts?**

*Over 10 years experienced service for*

- Tax Returns (Individuals & Businesses)
- GST & BAS
- Bookkeeping (QuickBooks & MYOB)
- Financial Reports
- Company Incorporations
- Small Business Solutions

***FREE INITIAL CONSULTATION***



**Advance Accounting & Taxation Consultants**

**Amali Liyanage** *(M.Com, B.Sc, ASA) Registered Tax Agent*

*1/98,Plumpton Avenue, Glenroy,3046*

*advanceab@gmail.com 0433732854*